
# තෙසකුණු ජාතකය



සංස්කරණය

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.

# ප්‍රදර්ශනවාදියෝ

වෙසක් සමය හමාරවිය. සම්බුදු තෙමඟුලෙන් දෙරණත වෙළි ගියේය. බුද්ධාලම්භන ප්‍රීතියෙන් ඔඳ වැඩී ගිය උවැසි උවැසියෝ වෙසක් තොරණ ඉදි කළෝය, පහන් කූඩු තැනූවෝය, දන්සල් දුන්නෝය, පන්සල් ගියෝය.



මව, පියා ඝාතනය කළ අජාසත්ත පුත්තුද, ස්ත්‍රී දූෂකයෝද, බාලාපචරකයෝද, මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ හා කොමිස් කාක්කෝද කපටි දේශපාලනඥයෝද ඒ අතර වූහ. උන් හැම පන්සල් ගොස් බුදුන් වැන්දෝය. පන්සිල් සමාදාන් වූහ. විහාරාධිපති හිමියෝ මේ කිසිත් නොදන එන යන හැම එකා අතම පිරිත් නූල් ගැට ගැසුවෝය.

**එච්. එම්. ජී. රවීන්ද්‍රසිංහ හේරත්,**
**පන්නල.**
**(17.05.2015 - ඉරිදා ලංකාදීප)**

කසිප්පු පෙරන්නා වැඩි වැඩියෙන් පෙරන්නට ලැබේවායිද, ස්ත්‍රීන් පනහක් දූෂණය කළ අය එය සියය දක්වා වර්ධනය කරගැනීමටද, බාලාපචාර්යා සිය ගොදුරු වැඩිකර ගැනීමටද, කපටි දේශපාලකයා ජනතාව ගොනාට අන්දවා නැවත බලයට ඒමට ඉඩ ලැබේවායිද, ආශිර්වාද පැතුයේ වළලු කර සිට වැලමිට දක්වාම පිරිත් නූල් ගැට ගසාගෙනය.

බුදුන්ගේ නාමයෙන් ආගම දහම විකුණාගෙන කන අය ඒ අතර විරල නොවූහ. සුදුපිරුවට හැඳ මහා බෞද්ධයින් සේ හැසිරෙන ඔවුන් දකින ඔබ එක් දෙයක් දැනගත යුතුය. හොරකම, මැරකම, අල්ලස, දුරාචාරය මේ කිසිත් නැති සැබෑ ජනහිතකාමී මිනිස්සු ද අප අතර වෙති. ලක්ෂ ගණන් ඇඳුම් ආයිත්තම් ඔවුන් ළඟ නැත. කරුණාව, දයාව, මානව හිතවාදී බව, අනෙකාගේ දුක දැනී උණුවන හදවත් ඇති ඔවුන් හැමවිටම යුක්තිය, සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින්නේය. පිරිත් නූල් අත නොරැඳි ඔවුන් ළඟ චාම් සරළ බව ඇත. හදවතේ එක් කොනක පිරිත් නූල ගැට ගසාගත් ඔවුහු සැබෑ බොදුනුවෝය.

# තෙසකුණු ජාතකය

## අංක : 20

*සංස්කරණය*

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.

**නමො තසස භගවතො අරහතො සමමා සම්බුදධසස !!!**

තවද මෙම ජාතක කථා වස්තුව අපගේ අතීත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් අනේපිඬු සිටුතුමාන් විසින් පූජා කරණ ලද ජේතවන විහාරයේ වැඩවසන සමයෙහි පසේනදි කොසොල් මහරජතුමාට අවවාදනානු වශයෙන් වදාරණ ලදී.

දිනක් බණ අසන පිණිස විහාරයට ගියාවූ කොසොල් රජතුමාට ආමන්ත්‍රණය කොට වදාරණ සේක්, මහරජ, රජදරුවන් විසින් දසරාජ ධර්මයෙන් රාජ්‍ය පාලන කටයුතු කළ යුත්තේය. යම් කලෙක රජතුමා අධර්මවාදි වූවාහු නම් එවිට රාජ සේවකයෝද අධාර්මික වන්නාහ. යනාදියෙන් අවවාද කොට නිරයට යාමෙහි ආදීනවද, සුගතිගාමී වීමේ අනුසස්ද වදාර පඤ්චකාමය නම් සිහිනයකට බඳු උපමා ඇත්තේයයි, යනාදියෙන් කාමයෙහි ආදීනව විස්තර වශයෙන් ප්‍රකාශ කොට වදාරා ඔහු කෙරෙහි විශ්වාසයක් නම් නැත. අල්ලස් ගත් කෙනෙක් නම් නැත. කලකෝළහල නම් නැත. එනිසා සියළු සත්වයෝම දුගතිගාමී වීමත් නම් නැත. මිය පරළොව යන්නාවූ සත්වයා තමා විසින් කරණ ලද්දාවූ පුණ්‍ය කර්මයක් විනා අන් සරණක් නම් නැත්තේය. එනිසා මොහොතක් හෝ ප්‍රමාද නොවිය යුතු, අප්‍රමාදව ධර්මයෙන් රාජ්‍ය කරව, පුරාතණයෙහි රජදරුවෝ අබුද්ධෝත්පාද කාලයෙහි නුවණැත්තවුන්ගේ, අවවාදයෙහි පිහිටා දැහැමෙන් රාජ්‍ය කොට සදිව්‍යලෝකයෙහිම ගියෝ වේදැයි වදාරා ඒ කොසොල් රජතුමා විසින් ආරාධිත වූ භාග්‍යවතුන් වහන්සේ විසින් ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්ම දත්ත නම් රජකෙනෙකු රාජ්‍යය කරන්නාහ. දරු සම්පත් නොලද රජතුමා දේවතා ආරාධනා කොටත් එයින්ද ඵලයක් නොලද රජතුමා එක් දවසක් රජතුමා සපිරිවරින් යුක්තව උයන් කෙළියට ගොස් දිවා භාගය උයනෙහි ගතකර සවස් වේලෙහි මඟුල් සල් ගස මුල යහනක් අතුරුවා මද වේලාවක් එහි සැතපී පිබිද සල්ගස උඩ බැලූ කල්හි කුරුළු කැදැල්ලක් දක දශීණය හා සමඟ මහත් සේ ආදර උපදවා එක් පුරුෂයකු කැඳවා කියන්නාහු, ''මේ ගසට නැග අර පෙණෙන කුරුළු කැදැල්ලෙහි මොකුත් තිබේදැයි බලව'' යි කීහ. රජතුමාගේ අණ පරිදි ගසට නැග බැලූකල බිත්තර තුනක් දැක ඒ බැව් රජතුමාට දැන්වූහ.

එවිට රජතුමා එම බිජු කුමණ පක්ෂීන්ගේ දැයි ? විමසුකල, '' දේවයන් වහන්ස, මම එය නොදනිමි, වැදි පුත්‍රයන් ගෙන්නම් එම බිජු කුමණ පක්ෂීන්ගෙ දැයි දැනගත හැකියයි කී පසු, වැද්දක් කැඳවා විමසූ පසු, ''මහරජතුමනි, මේ එක බිජුවක් බකමුහුණු බිජුවකි, එකක් ගිරා බිජුවකි, අනෙක සැළලිහිණි බිජුවකයි'' කීහ. එවිට රජතුමා අසා සිටියේ එකම කුරුළු කූඩුවක පක්ෂීන් තුන් වර්ගයක බිත්තර තිබෙන්නේ කෙසේදැයි, යි විමසීය. ''මහ රජතුමනි, උපද්‍රවයක් නැති කල්හි එයටද උපද්‍රවයක් නැත'' යි කීහ. එවර රජතුමා සිතනුයේ අන්කිසිවක් නොව '' මම දරුවන් ඉල්ලා දේවාරාධානා කලත් දරුවන් නැති නිසා මොවුන් ඒකාන්තයෙන්ම මගේ දරුවෝම විය යුතුය'' යි සිතා හිතවත් අමාත්‍යයෝ තුන්දෙනෙක් කැඳවා ඔවුන් තුන්දෙනාට එම බිත්තර සුරක්ෂිත කොට තබා රැකුව. එයින් දරුවන් බිහිවූ කල මට කියවයි'' සම්මත කළහ.

එම අමාත්‍යයෝද රජ අණ පිළිපදිමින් බිත්තර රක්නා පළමුව බිඳුණු බිත්තරයෙන් බකමුණු පැටියෙක් එළියට ආහ. අමාත්‍යයා වැද්දන් කැඳවා ස්ත්‍රී පුරුෂ භාවය විමසා පුරුෂ බැව් කී කල්හි රජතුමා වෙත ගොස් එපවත් සැළකලහ. එවිට රජතුමා මහත් සතුටට පත්ව අමාත්‍යයාට බොහෝ තෑගි දී අද පටන් මාගේ පුත්‍ර රත්නයට ''**වෙස්සන්තර කුමාරයෝ**'' යී නම් තබව'' යි කියා යැවූහ. ඒ අමාත්‍යයාද රජදරුවා මනා ආරක්ෂා සහිතව ආදරයෙන් ඇති දැඩි කළේය.

ඊට නොබෝ දිනකට පසු සැළලිහිණි පැටියෙක්ද බිහි වූහ. ඒ භාරව සිටි ඇමතියාද වැද්දන් ගෙන්වා පරීක්ෂා කල තැනේදී ස්ත්‍රී බැව් කී පසු දෙවන අමාත්‍යයාත් වැද්දන්ට තෑගි දී යවා රජතුමා වෙත පැටියා ගෙණගොස්, ''රජතුමනි, සතුටුවන්න ඔබ වහන්සේට දියණියකුත් එකතු උනයි '' කී පසු පෙරසේම සතුටට පත්ව මාගේ දියණියට මෙතැන් පටන් ''**කුණ්ඩලී**'' යයි නම් තබවයි කියා ඔහුටද බොහෝ තෑගි දී මාගේ දියණියට මනා ආරක්ෂා කර රකුවයි කීවේය.

එයට කිහිප දවසකට පසුව ගිරා පැටියෙක්ද බිජුව බිඳ මෙලොව එළිය බලන්නට එක්වූහ. එම බිජුවට භාර ඇමතියාද වැද්දන් ගෙන්වා තෑගි දී ස්ත්‍රී පුරුෂ භාවය විසඳා පිරිමි සතකු බැව් දැන රජතුමා වෙත ගොස්, '' දේවයන් වහන්ස, ඔබ වහන්සේට තවත් පුත්‍ර රත්නයක් එක්වී යයි'' කී පසු බොහෝ සතුටට පත්ව තෑගි බෝග දී මපුතුණුවන් හොඳින් රැකබලා පෝෂණය කරන්නැයි කියා පුතුණුවන්ට '' **ජම්බුක**'' යයි නම් තබා භාර දුන්නේය.

මෙසේ එම පක්ෂීහු තුන්දෙනා ඇමතිවරු තිදෙනෙකු යටතේ පෝෂණය වන අතර රජතුමාද මාගේ වැඩිමහල් පුතණුවෝය, බාල පුතණුවෝය, එකම දියණියෝයය, යන නම් භාවිතා කරමින් සිටින්නාහ. රජතුමා එසේ පවනස විට ඇමතිවරු අනේ අපේ රජතුමා තිරිසන් සතුන්ට මාගේ පුතා, මාගේ දියණිය යයි කීම නිසා විහිළුවකට ගෙන සිනාසීම නිසා රජතුමා සිතන සේක්, මේ ඇමතියෝ මාගේ දරුවන්ගේ වීවරදැයි, ප්‍රඥාසමෘද්ධය වෙයි, නොදන්නාහ. එමනිසා ඔවුන්ගේ විවර මුන් හැමට පෙන්වමියි සිතා එක් අමාත්‍යයකු ළඟට කැඳවා සබඳ අමාත්‍ය, තොප වෙස්සන්තර පුතා වෙත ගොස් නුඹ වහන්සේගේ පියාණන් වහන්සේ නුඹ වහන්සේගෙන් ප්‍රශ්නයක් විචාරනු කැමති සේක. කවදා ඇවිත් විචාරණ සේක්ද? දැනගෙන එවයි කියා යැවූහ.

එවිට අමාත්‍යයෝද වෙස්සන්තර කුමාරයන් වෙත ගොස් රාජ කුමාරයෙකුට සමාන ගරු සරු කර තමා ආ කාරිය කීවේය. කුමාරයෝ එබස් අසා තමා රැකබලා ගන්නා අමාත්‍යයා කැඳවා කියන්නාහු, '' මපියාණන් වහන්සේ මාගෙන් කාරණයක් දැන ගැනීමට අවශ්‍යලු, ඒ සඳහා මපියාණන් වහන්සේ තනිව නොව සපිරිවරින් එන නිසා පියාණන් වහන්සේට සේම ඒ එන හැමටම සත්කාර කළ යුතුය. ඒනිසා මපියාණන් වහන්සේට මෙහි කවදා වඩින්ට කියමුදෝයි, අමාත්‍යයා

විමසීය. එවිට අමාත්‍යයා කියන්නේ අදට සත්වනදා වඩින සේක්වා'' යි කීහ. කුමාරයෝද රජතුමා එවි ඇමතියාට එපවත් දන්වා යැවීය. සම්මත දිනය අනුව රජතුමා සපිරිවරින් තම පුතණුවන් වෙත ගියහ. එවිට වෙස්සන්තර කුමාරයාගේ උපස්ථාන අමාත්‍යයාද කුමරුගේ නියෝග අනුව ආපිරිසට අයත් දැසි දස්සන්ට පවා මහත් සත්කාර කළහ. රජතුමාද කුමාරයන්ගෙන් බත් අනුභව කළේය.

ඉන්පසු රජතුමා මාළිගා මිදුලේ අගනා මණ්ඩපයක් සාදවා සියළු නුවරවාසීන්ට රැස්වෙන ලෙස දන්වා මපුතණුවන් කැඳවා එන්නැයි රන් පුටුවක් පිළියෙල කොට අමාත්‍යයකු පිරිවර සමඟ යැවීය. වෙස්සන්තර කුමාරයන් කැඳවාගෙන එන අවස්ථාව වනවිට රජ මාළිගා භූමිය පුරාවට නුවරවාසීන්, ඇතුළු ඇමතිවරුද, සෙසු අයද පිරී සිටියහ. එම අවස්ථාවේ පැමිණියාවූ ඒ පක්ෂියාද රජතුමාගේ උකුලේ වාඩිවී ප්‍රිය මනාප පිළිසඳරෙහි යෙදී නැවතත් ගොස් තම ආසනයෙහි ඉඳ ගත්තේය. ඉන්පසු රජතුමාද ජනයා මධ්‍යයෙහි රජදරුවන් විසින් පිළිපදින රාජ ධර්මයන් විචාරන්නාහු, මෙසේ කියත්, ''වෙස්සන්තර නම් පක්ෂියාණනි, තොපට යහපතක් වේවයි, රාජ්‍ය කරන්නාවූ කැමති රජවරුන් විසින් කිනම් කෘත්‍යයක් මනා කොට කරණ ලද්දේ උතුම්ද ? ඒ කාරණය මම තොපගෙන් විචාරමි. එය මට පැහැදිළි කර දෙව'' යී කීහ.

රජතුමා විචාළ කල්හි වෙස්සන්තර කුමාරයෝ විචාළාවූ ප්‍රශ්නය නොකියාම පළමු කොට පිය රජතුමාගේ ප්‍රමාද වශයෙන් චෝදනා කරන්නාහු'' මාගේ පියාණන් වහන්ස, බොහෝ කාලයක් බරණැස් නුවරට අනුශාසනා කරන සේක්, නුවර වාසීන් විසින් මේ රජ්ජුරුවෝ තිරිසනුන්ට පුතු භාවයෙන් ව්‍යවහර කෙරෙති, යි කියා අපහාස කිරීම් හේතු කොට ගෙන මෙබඳුවූ නුවණැත්තන්හූ සමීපයෙහි සිටියදී ප්‍රශ්න නොවිචාරීමෙන් ඒකාන්තයෙන්ම ප්‍රමාද වාසයට තමන් වහන්සේ පැමිණ ශීලාදී ගුණයෙන් ප්‍රමාද වූවාහු මාගෙන් අද විචාරණ සේකයි, යනාදියෙන් චෝදනා කොට නැවත කියන්නාහු,

''මහරජතුමනි, රජදරුවන් විසින් රාජධර්මයන් තුන්දෙනෙකු කෙරෙහි පිහිටිය යුත්තේ යයි කියා පළමු කොට බොරුව ඉවත්කල යුත්තේය, මුසාවාදාදියෙන් යුතු රජදරුවන් ගේ රාජ්‍යයෙහි තෘණ, වෘක්ෂ ලතාදියෙහි ඕජාත ගුණය නැතිවන්නේය. වී ගොවිතැන් ආදී වෙනත් ශෂ්‍යයන් කරන්නාවූ භූමියෙහි ඕජාවාද රියන් හතක් පහතට

බසින්නේය. එකල සත්වයෝ අනුභව කරන්නාවූ ආහාරයෙහිද තේල, මී, හකුරු ආදියෙහිද ඖෂධයෙහිද ඕජාවාද අනුභවයද නැත්තේය. එසේ ඕජා රහිතවූ භෝජනය අනුභව කලාවූ සත්වයෝ බොහෝ ලෙඩ රෝග වලට ගොදුරු වන්නාහ. තවද, ඒ මුසාවාදීවූ රජ්ජුරුවන්ගේ රාජ්‍යයෙහි දියෙන්, ගොඩින් වන්නාවූ යම් කෙනෙක් වෙත්නම් එයද නෙලැබෙන්නේය. එම වස්තු නොලද කල්හි රජවරු දුගී වන්නාහ. එවිට සේවකයන්ට සංග්‍රහ කිරීම් අඩපණ වන්නේය. අසංගෘහිත රජදරුවන්ට සියල්ලෝම ආධාර නොකරන්නාහ.

එමනිසා පියාණන් වහන්ස, මෙසේ නිරොජස්ක බොරුව ජීවිතය පිණිසවත් නොකිය යුත්තේය. සත්‍ය වචනයෙහිම ඉතා මධුරවූ රස ඇත්තේය. එනිසා සත්‍ය වචනය රසායනයක් සේ රැකිය යුත්තේය. තවද, මුසාවාදය සත්වයන්ගේ අවශේෂවූ යම් ගුණයක් මකන්නේය. ඊළඟ ආත්ම භාවයෙහි නිරයොත්පත්තිය අවසන්කොට ඇත්තේය. එනිසා මුසාවාදයෙන් වැළකිය යුත්තේය. තවද, පියාණන් වහන්ස, රජදරුවන් විසින් නම් පළමුකොට කිපීම සමභාව කොට ඇති ක්‍රෝධය වැළකිය යුතු වන්නේය. එම කාරණයෙන් අවශේෂ සත්වයන්ගේ කෝපය හා මුදුන් නොපැමිණෙන්නේය. රැජවරුන්ට වචනායුධ හෙයින් කෝපයෙන් යුතුව බැලුව පමණකිනුත් සත්වයන්ට විනාශයට හේතු නිසා වහාමුදුන් පැමිණෙන්නේය. එම කාරණයෙන් අවශේෂ සත්වයන් විචරට වඩා අතිශයින්ම කෝපය නොවිය යුත්තේය.

ශාන්තියෙන්ද, මෛත්‍රියෙන්ද, දයාවෙන්ද යුක්ත එකම පුතකු ඇති මවකමෙන් ප්‍රියදර්ශණයෙන් ලෝකවාසීන්ට අනුශාසනා කළ යුත්තේය. අධිකවූ කෝප ඇති රජහට උපන් යසස එතෙම ස්ථාවරකොට ගත නොහැකි වන්නේය. ''තවද මහරජතුමනි, චුල්ල ධම්පාල ජාතකයෙහි මහා ප්‍රතාප නම් රජතුමා තමාගේ පුත්‍රයා මරා දරු ශෝකයෙන් ළය පැලී මළාවූ බිසවුන් කෙරෙහි ඔහුද ශෝක කොට පශ්චාත්තාපයට පත්ව අවීචිමහ නරකයට පණපිටින් ගිය බව සිහිකර පළමුව මුසාවාදයෙන් වැළකී, දෙවනුව වෛරයෙන්, පළිගැනීමෙන් වැළකිය යුත්තේය''

තවද, මහරජතුමනි, රජදරුවන් විසින් එක්ව ක්‍රීඩාශීලි නොවිය යුතුය. සිහිපත් ඇතුවම රාජ්‍ය පාලනය කල යුතුය. ක්‍රීඩාවෙහි විදග්ධවූ චඤ්චලවූ සිත් ඇති රජතෙමේ අමාත්‍යස්තව කටයුතු විචාරන්නේය.

එතෙම තමහට උපන් කීර්ති, ප්‍රසන්සා ආරක්‍ෂා කරගැනීමට නොහැකිව කරදර ප්‍රශ්න ඇතිකර ගන්නේය. ඒ කුමක්මෙන්ද යතහොත් සරභංග ජාතකයෙහි කීම්බස් අසා කිසවච්ඡ තාපසයන්ට ද්‍රොහිකම් කොට රාජ්‍යය හා සමඟ නැසී තුමුද සහපිරිවරින් ගොස් කුක්කලී නම් නිරයෙහි උපන්හ. තවද, මාතාඞ්ග ජාතකයෙහි මෙජන්ධ නම් රජතුමා බමුණන්ගේ බස් ගිවිස මාතාඞ්ග පණ්ඩිතයන්ට පීඩා කොට රාජවාසීන් සමඟම විනාශයට පැමිණ නිරයෙහි උපන්හ. එමනිසා අපරික්‍ෂාකාරී රජදරුවෝ තමන්ට පැමිණි කීර්ති, ප්‍රසන්සා ආරක්‍ෂාකර නොගෙන තමාත් තමාගේ පිරිසත්, රටවැසියාත් දුකෙන් දුකටම වැටෙන්නේය. එමනිසා මපියාණන් වහන්ස, රජදරුවන් විසින් පළමු කොට මුසාවාදය අත්හල යුත්තේය, දෙවනුව ක්‍රෝධය, මාන්නය, පළිගැනීම අත්හැරිය යුතුය. තුන්වැනිව ක්‍රීඩාහීලිව රාජ්‍යය පරිපාලනයෙහි ප්‍රමාදබව දුරුකටයුතු වන්නේය.

ඉක්බිති එම කාරණා ඉවත්කොට රාජ්‍යවාසීන්ට කළයුතු අනුශාසනා කටයුතු වන්නේය. එසේ කිරීම රජදරුවන්ගේ වුතසමාදානය, කැයි පැරණි ඥානවන්තයෝ පවසන්නාහ. එමනිසා මපියාණන් වහන්ස, මීට පළමු ඔබ වහන්සේ රාගාදී වශයෙන් පශ්චාත්තාපයට නිසිවූ යම් අකුසල කර්‍මයක් කළසේක් නම්, මෙයින් පසුවම එබන්දක් නොකළ මැනව. තවද, රාජ්‍යයට වැඩපසන්නාවූ රජතුමනි, ප්‍රමාදව වාසය ඇති රජකුගේ සියළුම භෝගයෝ විනාශයට පැමිණෙන්නාහ. එයට හේතුව කුමක්ද? යත් ශ්‍රීයාව, කාළකන්නීය යන මොවුන් දෙදෙනා අතුරෙන් ශ්‍රී තොමෝ කියන්නී යම් සත්වයෙක් උට්ඨානවීර්‍ය්‍යය ඇතිව අප්‍රමාදව කුසල් කෙරේද, අන්සතු වස්තු දැක ලෝභ නූපදවා ඔහු කෙරෙහි මම අභිරමණය කරන්නෙමයි, කිව එනිසා දේවයන් වහන්ස, ඔබ වහන්සේ සියල්ලවුන්ටම ආරක්‍ෂාව සළසා කාලකන්නියට අවස්ථාව නොදී ශ්‍රීයමවාසස්ථාව වුව මැන.

තවද, කාසි රාජ්‍යයට අධිපතවූ මහ රජ්ජුරුවන් වහන්ස, ඒ පුරුෂතෙමේ ප්‍රඥාවෙන් හා වීර්‍ය්‍යයෙන් යුක්තවූයේ මහත්වූ අදහසින් සොරුන්ට පිහිට වූ පස මිතුරන් අල්වා නසන්නේ මුල් සිඳුනේ නම් වෙයි. සොරුන් තමාත් නසන්නේ අක්සිඳුනේ නම් වන්නේය. දේවයන් වහන්ස, සක්දෙව් රජු පවා උට්ඨානවීර්‍යයෙහි අප්‍රමාදව දෙදෙව්ලොව දෙවියන් සමඟ කණිට්ඨන නම් ආශ්‍රම දේශයට ගොස් සරභංග ශාස්තෘන් කෙරෙත් ප්‍රශ්න විචාරා ධර්‍මය ඇසූහ. භාග්‍යවත් අභීත් කාශ්‍යප

සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශාසනය පිරිහීගෙන යනු දැක තමාගේ ආනුභාවයෙන්ම මහජනයා පහදවා පිරිහී යන සම්බුඬ ශාසනය නැවත දීර්ඝකාලයක් පවත්නා පරිද්දෙන් ආරක්ෂා කළහ. එමනිසා දෙවිවරු පවා උත්ථානවීර්‍ය්‍යයෙහි සිත යොමු කළහ.

තවද, මපියාණන් වහන්ස, චාතුර්මහාරාජික දිව්‍ය ලෝකයෙන් යට අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ, ඕපපාතික, සංඛ්‍යාතවූ සතර යෝනියෙහි උපන්නාවූ දේවතාවෝද, බ්‍රහ්මයෝද, සදිව්‍යලෝකයෙහි දෙවියන්ද ? යන මේ සියළු දේවතාවෝ කුශල බලවත්වූ අදහසක් ඇති එබඳුවූ රජතුමන් හා සමාන ජීවිකාවෙන් ජීවත් වන්නාහ. එබඳුවූ කුශලයෙහි අදහස් ඇති රජදරුවෝ දානාදිවූ පින්කම් කොට දෙවියන්ට පිං අනුමෝදන් කරන්නාහ. එම දේවතාවෝ එම පිං අන්මෝදන්ව දිව්‍ය සපිරිවරින් වැඩෙන්නාහ. එසේවූ දිව්‍ය ඓශ්වර්‍ය්‍යයෙන් අභිවෘඬියට පැමිණියාවූ ඒ දේවතාවෝ නිතර වීර්‍ය්‍යකොට පින් කරන්නාවූ අප්‍රමාද වාසය ඇත්තාවූ එබඳු රජදරුවන්ට ධාර්මිකවූ රක්ෂාවරණ ගුප්තිය කෙරෙමින් පිටුපස ඡායාවක් මෙන් සිටින්නාහ.

මහරජතුමනි, ඔබ වහන්සේ දස කුසල ධර්මයෙහි අප්‍රමාදව සියළු කාර්‍ය්‍ය කළ මැනව. මපියාණන් වහන්ස, ඔබ වහන්සේ මාගෙන් කුමන කාරියක් කළකල උතුම්දැයි යම් රාජධර්මයක් විචාළසේක් නම්, ඒ නුඹ වහන්සේ විචාළ සැනයෙන් මා විසින් පළමුකොට මුසාවාදය දුරුකටයුතු යැයි යනාදියෙන් යම් මේ චුතකොට්ඨාස කෙතෙක් කියන ලද්දාහු නම් එහිම පැවැත්ම මැනවයි, ඒ මා විසින් කියන ලද්දාවූ ආචාරවෘත්තයම ඔබ වහන්සේට අවවාද අනුශාසනා නොවන්නේය. මෙසේ මේ ධර්මයෙහි පවත්නාවූ රජදරුවෝ නම් තමන්ගේ මිතුරන්ට සතුට ලබා දෙන්නටත්, සතුරන්ට දුක ලබා දෙන්නටත් සමර්ථවන්නාහයි, මෙසේ වෙස්සන්තර නම් පක්ෂි රාජයා විසින් රජතුමාට ධර්මදේශනා කල කල්හී සර්වඥ විලාශයෙන් ප්‍රශ්න විස්සජ්ජනය කරන ලදැයි මහජනයා පුදුමයට පත්ව සාධුකාර පැවත්වූහ.

රජතුමාද සතුටට පත්ව අමාත්‍යන් කැඳවා මාගේ පුතුවූ වෙස්සන්තරයන් මෙසේ කියන තැනැත්තන් විසින් කුමන දෙයක් කරන ලදදැයි විචාරා ''දේවයන් වහන්ස, අයකැමි අමාත්‍ය තනතුරට සුදුසු යැ'' යි කී කල්හී, එසේනම් ඔහුට එම තනතුර දෙමි, යී කියා එතැන් පටන් වෙස්සන්තර කුරුළු පුතා එම තනතුරේ පිහිටුවා ලූහ. පුතාද එම

කාර්‍ය්‍යය මැනවින් කරන අතර පියරජතුමාට අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කරන්නේය. මෙසේ කිහිප දවසක් ගියපසු රජතුමා පෙරසේම තම ''කුණ්ඩලී'' නම් ලිහිණි දුවත් කැඳවා තම උකුලමත තබා දරු සෙනහස පා සුහද කථාවෙන් පසු රැස්වූ ජනකාය මධ්‍යයෙහි පණවන ලද රන් ආසනයේ තැන්පත්වූ පසු රජතුමා ධර්මය විචාරන්නාහු.

''මාගේ දියණියනි, රජකම් කරනු කැමති රජදරුවන් විසින් කුමණ කාරියක් කිරීම උතුම්ද? මාගේ දියණියනි, සියළු රාජ ධර්මයන් තත්වූ පරිද්දෙන් කියව'' යි කීහ. රජතුමා වෙස්සන්තර පුතා ගෙන් එම ප්‍රශ්න නොවිචාරා කුණ්ඩලී නම් ලිහිණියගෙන් මේ ප්‍රශ්නය විචාලෝද යත් :- ස්ත්‍රී බැවින් විචාළහ. ස්ත්‍රිය නම් ස්වල්පවූ නුවණ ඇත්තාහ. එනිසා කියන්ට සමාර්ථයොනම් කියතියි. ඇයගේ නුවණ පරීක්‍ෂා කිරීම සඳහා ඇයගෙන්ම මෙම ප්‍රශ්නය ඇසීය. එවිට කුණ්ඩලී විසින් කියා සිටියේ, මපියාණන් වහන්ස, ඔබ වහන්සේ මෙසේ ස්ත්‍රීහුනම් නුවණ මදහෙයින් කුමක් කියා පරීක්‍ෂා කිරීම් වශයෙන් විචාරතියි සිතමි. එනිසා මම ඔබ වහන්සේට සියළු රාජධර්මය පද දෙකකින්ම ඇතුලත් කොට කියමි, කියා ප්‍රශ්න විස්සජ්ජනය කරන්නාවූ ලිහිණිතුමී මෙසේ කීහ.

''මපියාණන් වහන්ස, යම් කාරණා පද වශයෙන් සියළු අර්ථජාත සහ හිත සැප පිහිටියෙ නම්, එසේ වූ කරනා පදාශ්‍රවයෝ දෙදෙනෙක්ම වන්නාහ. පෙර නොලබන ලද ලාභයාගේ ලැබීමය. ලැබෙන ලාභය නිසි පරිදි පරිහරණය කරමින් ආරක්‍ෂාකර ගැනීම, මෙම කාරණා දෙකය. පියාණනි, නූපන් ලාභය ඉපදවුම් බැරි නොවන්නේය. උපන් ලාභය සොරසතුරන්ගෙන් විනාශ නොවී ආරක්‍ෂා කර ගැනීම අසීරුය. ඇතැම් කෙනෙක් මාන්නය උපදවාගෙන ප්‍රමාද වූයේ, ප්‍රාණඝාතාදි අකුශලධර්මයන් කරන්නේ ප්‍රසිද්ධ වූ සොරකම් කරන්නේ රට කොල්ලකා ඇවිදින්නේය. එවිට ඔවුන් අත්අඩංගුවට ගෙන දඬුවම් පමුණුවන්නේය. එසේ නොමැතිනම් එම වස්තුව වියදම් කර පඤ්චකාම වස්තුවට අයත් දේ වෙනුවෙන් තෘෂ්ණාව ඇතිව ප්‍රමාදව මෝඩකමින් වස්තුව නිකරුණේ අවසන් වූ පසු දුගී තත්වයට සැමටම අතපාමින් ණය, සිඟමන්, ආධාර පතමින් ඇවිදින්නේය. එකල්හි ප්‍රවුජිතයන් වහන්සේ ග්‍රන්ථධූර විදර්ශනා ධූරයෙහි යෙදී වාසය කිරීමෙන් ලා සත්කාර උපදවා ටික කාලයකින් නොදනුවත් කමින් ප්‍රමාදව ගිහි භාවයට පැමිණෙන සේකයි, ඇතැම් තපස් කෙනෙකුන් වහන්සේ ප්‍රත්‍රම ධ්‍යානාදිය උපදවාත් සිහිමුලාවෙන් එබඳුවූ රූපාලම්බනයකැයි බැඳී

ධ්‍යනයෙන් පිරිහෙන්නේය.

එනිසා උපන්නාවූ යස පිරිවර හා සම්පත් ධ්‍යානාදීන් ලැබ රක්‍ෂා කිරීම දුෂ්කර වන්නේය. ඇතැම් කෙනෙක් ලාභ සත්කාර උපදවා අප්‍රමදව කුශල කර්‍මයෙහි යෙදී වාසය කරන්නේනම්, ඔහුගේ යසස පුරපස චන්ද්‍රයා මෙන් දිනෙන් දින වර්‍ධණය වන්නේය. එනිසා දේවයන් වහන්ස, ඔබ වහන්සේ අප්‍රමාදව ප්‍රයෝග සම්පත්තියෙහි යෙදීමෙන් දැහැමින් සෙමින් රාජ්‍යය කරමින් ඔබවහන්සේට උපන්නාවූ කීර්ති ප්‍රසන්සා නොනසා ආරක්‍ෂා කරගනු මැනව. දේවයන් වහන්ස, දූත ක්‍රීඩාවෙහි ලොල්නොවූ කෛරාටික නොවන්නාවූ, පූප සුරාගන්‍ධාදියෙහි ලොල් නොවන්නාවූ නුඹ වහන්සේ සතු ධනධාන්‍යාදිය විනාශවන කරුණු කාරණා දන්නාවූ ධෛර්‍ය දෙකින් යුක්තවූ අමාත්‍යයන් දූන හැඳින භාණ්ඩාගාර නොයෙක් කාර්‍ය්‍යයෙහි යොදාගත මැනව. තවද, මපියාණන් වහන්ස, යම් අමාත්‍යකේ ඔබ වහන්සේ සතු ධනයක් ඇත්නම් එම සියළු වස්තුව නොනසා සුරක්‍ෂිත කොට ආරක්‍ෂා කරන්නේ නම් එසේවූ පුරුෂ තෙම ඔබ වහන්සේය නියම පක්‍ෂකාමී අමාත්‍ය නම් වන්නේය. එබඳු පුරුෂයාගේ භාණ්ඩාගාර ගෙයි කාරිය කරවනු මැනව.

එසේම මහ රජතුමනි, යම් රජ කෙනෙකුගේ ඇතුලෙහි ඇවිදින දූගී පොහොසත් සත්වයෝ රත්තරන් සහ වස්ත්‍රාභරණාදිය දීමෙන් සංග්‍රහ නොවුනානම් රජතුමාගේ අන්තඃපුරයෙහි තිබූ රන්රුවන් ආදි වස්තු සංග්‍රහනුවන්න වූ මනුෂ්‍යයන්ගේ වංශග්‍රහයෙන් මහත්වූ විනාශයට පැමිණෙන්නේය. ඇතුලේ හිත වශයෙන් කීකල කථාවකුත් පිටතට විස්තීර්‍ණ වන්නේය. එනිසා ඔබ වහන්සේ මඳකට සිත්ගන්නා ලද අන්තඃපුරවාසි ජනයන් ඇතිව මාගේ මෙතෙක් සම්පත් ඇතැයි ඔබ වහන්සේම වස්තුව පරීක්‍ෂා කොට අසවල් තැන මෙතෙක් වස්තු නිධානයන් ඇත්ද ප්‍රත්‍යක්‍ෂකොටම කළ මැනව. අසම්මුඛයේ යමෙක් කී කල එබස් අදහාගෙණ වස්තු සැඟවීමක් නොකළ මැනව.

තවද, පියාණන් වහන්ස, ඒ ඒ තැනින් උපදනා වස්තුවෙහි අයත් නොකරණ ලදැයි මෙකී සියල්ලන් නුඹ වහන්සේම දත මැනව, යුද්‍ධයෙහි හෝ වේවායි, නව කර්‍මයෙහි හෝ වේවායි, වෙනත් රාජකාරි කටයුත්තක් හෝ වේවයි, මොහු විසින් මෙනම් දෙයක් නොකරන ලදැයි මෙකී සියල්ලන් නුඹ වහන්සේ දත මැනව. අනුන්ගේ කීම් පිළිගත මැනව,

තවද, පියාණන් වහන්ස, රජ දරුවන් සේ නම් ගම් පැහැරීම, උමන්කැණීම් ආදීවූ නොයෙක් වැරදි කොට නිග්‍රහයට සුදුසු වූ පුරුෂයා අල්ලාගෙන ඇවිත් ඉදිරිපත් කල අවස්ථාවේ ඔහුගේ වැරදි විචාර පිරිසිදු කොට පැරණි රජදරුවන් විසින් නියම කොට තබන ලද නීතිය පරීක්‍ෂා කොට දෝෂානුරූප වූ නිග්‍රහය කරණ සේක්, යම් සත්වයෙක් පැරදවිය නොහැකි සේනාවක් පරාජය කරත්ද, විසිරුණු සේනාව රඳවන්ට සමර්ථවේද, යමෙක් ජීවිත පරිත්‍යාග කොට තම කාරිය කරන ලද්දේද, එබඳුවූ දෙයක් කරදුන් පුද්ගලයාට හෝ පිරිසට මහත් සංග්‍රහ කළ යුත්තේය. එසේ කිරීමෙන් රජතුමාගේ සියළු රාජකාරියෙහි අවශේෂ සත්වයෝත් ඔවුන්ගෙන් කළ මනාකාරිය ඒ කළ සංග්‍රහ බලා නොපමාව කරන්නාහ.

එසේම දේවයන් වහන්ස, දනව් වාසීන් අභිවෘද්ධියටත්, රට රැකීමටත් ඔබ වහන්සේ ප්‍රත්‍යක්‍ෂකොට දැනගෙන සියළු රාජ්‍ය වැස්සා හා දනව් වැසියන්ට අවවාද අනුශාසනා කොට වදාළ මැනව. ඔබ වහන්සේ නියෝගයෙන් ඒ ඒ ස්ථානයන්හී කාර්‍ය්‍ය සාධක ධූරයෙහි සිටින රාජපුරුෂයෝ අල්ලස් ගෙන හිමියන් අහිමියන් කොට අහිමියන් හිමියන් කොට අධිකරණයට යුක්තිය නැති කොට ඔබ වහන්සේගේ වස්තුවත්, රටත් නොනසත්ව, යි මෙකී කාරණාවෙන් අප්‍රමාදව ඔබ වහන්සේම රටවැසියන්ගේ සියළු යුක්තා යුක්ත විචාර සියළු සත්වයන්ට අවවාද අනුශාසනා කළ මැනව, අපරීක්‍ෂාකාරී යුහුසුළුව කිසිවක් නොකළ මැනව, පරීක්‍ෂාකොට ඡන්දයෙන්, දෙවශයෙන්, ලෝභයෙන්, භයෙන් යුතුව යුහුසුළුව කරණ කාරිය අනිටු විපාක දෙන්නාහ. කුමක් නිසාදයත් එබඳුවූ ඉක්මන් කාරි කොට මෝඩ සත්වයෝ, මෙලොවත්, පරලොවත් දුකෙන් දුකටම පත්වන්නේය. එමනිසා තමාට අයත් කාරිය ඉවසීමෙන් යුතුව කළ යුතුය.

තවද, මහරජතුමනි, යම් කලෙක විනිශ්චය මණ්ඩලයෙහි උන්නා වූ ඔබ වහන්සේ ඉදිරියට මිනිසකු ගෙනවුත් මොහු මිනිසකු මරණ ලදී, මං පැහැරහැරීමක කරණ ලදී, ස්ත්‍රී දූෂණයන් කරණ ලදී, යී කියා යමෙකු ඉදිරිපත් කරයිද ? එවිට ඔබ වහන්සේ එම චෝදනාව බලවත්වූ, ක්‍රෝධ සිතින් පිළිගෙන ඔහුට දඬුවම් නොකරව, මක් නිසාද ? යත් :- නිර්දෝෂී පුදුගලයන් වැරදිකරුවන් යැයි කියා ගෙනෙන බැවිනි. එමනිසා ඔබ වහන්සේ නොකර විරුද්ධවූ උභය පක්‍ෂයේ අයගේ කීම් අසා මනා කොට විචාර පිරිසිඳුකොට ඔබ වහන්සේට ප්‍රත්‍යක්‍ෂ වීමෙන්

ඔහු වැරදිකරුවකු බව දැන ඔහුට කළමනා නිග්‍රහ කළ මැනව.

රජවරුන් කෝපයක් ඇතිවූ පසු සිත සිහිල් නොකොට අනුන්ට දෝෂාරෝපණය නොකළ යුත්තේය. එසේම යම් කලෙක ලය සිසිල්ව, මොලොක්ව ගියේ නම් විනිශ්චය මණ්ඩලයෙහි ඉඳ සියළු රාජකාරිය විචාළ යුත්තේය. මපියාණන් වහන්ස, අධික ක්‍රෝධය හේතු කොට ගෙන වස්ත්‍රාභරණ ධනධාන්‍යාදීන් සමෘද්ධවූ බොහෝ රජදරුවෝ ක්‍ෂාන්තිවාද රජ්ජුරුවන් පරිද්දෙන් මහත් විනාශයට පැමිණියාහ. මම පෘථිවිශ්වරයෙමි කියා මහජනයා කායදුශ්චරිතාදියෙන් ඇවැඩෙහි නොයෙදුව මැනව, ඔබ වහන්සේගේ විජිතයෙහි මනුෂ්‍යයන්, තිරශ්චීතයන්, ස්ත්‍රී, පුරුෂයන්ට දුක්බොත් පත්තියක් නොවේවා, යම්සේ අධර්මිෂ්ඨ රජදරුවන්ගේ ජීවිතයේ මනුෂ්‍යයෝ කායදුශ්චරිතාදිය කොට නිරයෙහි උපදිද්ද එපරිද්දෙන් ඔබ වහන්සේගේ රාජ්‍ය වාසීන්ට නරකොත්පත්තිය නොකොට යම්සේ දුක් නොවිද්ද එපරිද්දෙන් කළ මැනව. යම් රජ කෙනෙක් කිසිවෙක්හි සංකාව නොකොට තමන්ගේ කාරිය සිහිපත් කෙරෙත්ද පක්‍ෂග්‍රාහි වශයෙන් යමක් කැමැත්තේනම් ඒ ඒ දෙය කෙරෙත්ද, හැරමිටියක් නැති අන්ධයෙකු මෙන්ද වන්නාහ. අත්තානුවාද භයින් නිර්භීතවූ ඒ රජ්ජුරුවන්ගේ සියළු බලය නැසෙන්නේය. එමනිසා දේවයන් වහන්ස, ඔබ වහන්සේ මා විසින් මෙතෙක් කියන ලද්දාවූ රාජ්‍යකාරියෙහි දක්‍ෂව, අලසව නොවී පින් දහම් කොට මත්පැනින් වැළකී සිල්වත්ව, අචාර සම්පන්නව, දස රාජධර්මයෙන්හි පිහිටා රාජ්‍ය කළ මැනව''. කියා ඒ කුණ්ඩලී නම් ලිහිණිය රජතුමාට ධර්මම දේශනා කළේය.

රජතුමා එබස් අසා සතුටුව ආමන්ත්‍රණය කොට කියන්නාහු, පින්වත් අමාත්‍යයෙනි, මාගේ දූ කුමරිය වූ කුණ්ඩලීය මෙසේ කියන තැනැත්තිය විසින් කවුරුන්, කවුරුන් විසින් කළමනාකාරිය කරණ ලදදූයි විචාරා දේවයන් වහන්ස, භාණ්ඩාගාරිකයා විසින් කළමනා දෙය කරණ ලදදූයි කී කල්හී, එසේනම් මෙතුමිය එම තනතුරෙහි පිහිටුවන්නැයි කී කල්හී, කුණ්ඩලී ලිහිණිය එම තනතුර සඳහා පත්කර ගත්හ. එතැන් පටන් ඇය එම තනතුර කරණ අතර පිය රජතුමාට කළමනා කාරියද සොයා බලා කරන්නේය.

ඉන්පසු රජතුමා තමාගේ අනෙක් පුත්‍රයා වූ ජම්බුක වෙත දූතයන් යවා සත්වන දින සපිරිවරින් තම පුත්‍රයා වෙත ගොස් බොහෝ

සත්කාර කර විඳ සතුටු සාමිච්චි කථාවෙන් පසු රජතුමාගේ ආරාධනාව පරිදි මාළිගා මිඳුලේ පනවන ලද ආසනයේ ජනතාව මාධ්‍යයෙහි අසුන් ගත්හ. එවිට රජතුමා මපුතණුවනි, තොපගේ සහෝදර වෙස්සන්තර අයියා සහ සහෝදරිය වන කුණ්ඩලීගෙන් රාජධර්මය විචාළෙමි. ඒ දෙදෙනාම තමන්ගේ ශක්ති පමණින් මහැඟි උතුම් අදශීමත් අවවාද රාශියක් ලදිමි.

පුත, ජම්බුකයෙනි, තොපගෙනුත් මට උතුම් රාජ ධර්ම බලයන් දැනගත යුතු නිසා මේ රැස්ව සිටින සියළුම අමාත්‍යයන් සහ ජනතාවටත් , මටත් ආදශීමත් ධර්මදේශනාවක් කරුණු මැනව, යී කීහ. රජතුමා මහ බෝසතාණන්ගෙන් ප්‍රශ්න විචාරනාහු සෙසුදෙනා වෙතින් විචාළ ආකාරයෙන් නොවිචාර විශේෂ කොට විචාළහ. එවිට රජතුමාට මහ බෝසතානෝ එසේනම් මහරජතුමනි, අසනු මැනව, තොපට සියළු රාජධර්ය කියා ධර්ම දේශනාව ආරම්භ කළහ.

''මහරජතුමනි, සත්ව ලෝකයෙහි මහත් වූ අධ්‍යාස ඇති පුරුෂයා කෙරෙහි පඤ්චවිධ බලයක් වන්නේය. ඒ පඤ්චවිධ බලයෙන් කාය බලය ප්‍රබලනම් ලාමක වන්නේය. එය කුමන හේතුවකින්ද ? යත් ඃ- අඥාන බල බැවිනි. එසේම කාය බල මහත්වී නමුත් ඒ බලයට වඩා කැටකිරිලි බලය අධික වන්නේය. ඇත් බලය අඥාන බල බැවින් මරණයට ප්‍රාප්ත විය. කැටකිරිලිය තමාගේ ප්‍රඥා සමර්ථයෙන් හස්ති රාජයා මරණයට පැමිණ වුව, එසේ හෙයින් සැමතැන්හි කාය බලය ප්‍රයෝජන නැත. මෝඩයන්ගේ කාය බලය ආත්ම බලය පිණිස වන්නේය. කාය බලයට වඩා හිරණ්‍ය ස්වර්ණදීවූ (රත්රන්, මුතු, මැණික්) භෝග බලයම ඉතා මහත් වන්නේය. ඒ භෝග බලයට වඩා භෙදබවට නොපමුණු වන්නාවූ මන්ත්‍රණ ඇති සෞරවීර්‍ය ඇති සන්හුන්නාවූ අමාත්‍ය මණ්ඩලයා ඇති කළ කියන ලද බලය සුඞ් යෝග්‍ය (සමඟි සම්පන්න) බැවින් පූර්ව බලයට ඉතා මහත් වන්නේය. බ්‍රහ්ම, වෛශ්‍ය, ක්‍ෂුද්‍ර යයි කියන ලද ත්‍රිවිධ කුලයන් ඉක්ම ක්‍ෂත්‍රිය කුල වශයෙන් ජාති සම්පන්නයෝම සුඩ වන්නාහ. යම් මේ චතුර්විධ බලයට වඩා නුවණැත්තාවූ සත්වතෙමේ පැමිණෙන්නේ නම් එම සියළුම බලයටම වඩා ප්‍රඥා බලයම ශ්‍රේෂ්ඨ වන්නේය. එම ප්‍රඥා බලයෙන් යුක්ත වූ සත්වතෙමේ අභිවෘද්ධියට පැමිණෙන්නේය.

"තවද, මපියාණන් වහන්ස, අප්‍රාඥවූ පුද්ගලයා මේ සප්තරත්නයෙන් සම්පූර්ණ වූ පෘථිවි මණ්ඩලය ලද්දේ වී නම් ඔහු නොකැමති පරිද්දෙන්ම බලහත්කාරයෙන් අන්‍යවූ ප්‍රඥාසම්පන්නයෙක් ඒ රාජ්‍යභාරය පිළිපදින්නේය. මෝඩ සත්වතෙම ලබන ලද්දාවූ යස ඉසුරු රක්නට වේවයි කුසල සන්තකවූ රාජ පරම්පරාවෙන් ආවාවූ රාජ්‍යයට පැමිණෙන්නට වේවයි, අසමර්ථ වන්නේය. ජාති සම්පත්තිය නිසා කුශල සන්තක රාජ්‍යය ලැබත් සියළු රාජ්‍යශ්‍රීන් යුත්තවත් ජීවත්ව ගත නොහෙන්නේය. උපායෙහි දක්ෂ නොවූ බැවින් දුගී වන්නේය. මෙසේ මහබෝසතාණන් වහන්සේ නොයෙක් කාරණයන් ප්‍රඥාහේතු ගුණ කියා ප්‍රඥාවට ප්‍රසන්සා කරන්නාහු. මෙසේද කීහ. මේ ලෝකයෙහි උතුම් ප්‍රඥා ඇති සත්වයා බහුශ්‍රැත බැවින් කරුණු කාරණා සහ යුක්තා යුක්ති විශේෂයෙන් නිශ්චය කරන්නේය. නැවත කීර්ති ඝෝෂාවටත් පැමිණෙන්නේය. ලාභ සත්කාරයත් වඩන්නේය. කරදර පැමිණි විට උපායෙහි දක්ෂ බැවින් නිර්භීතව සැපතට එන්නේය.

තවද පියාණන් වහන්ස, ප්‍රඥා පුද්ගලයන් සේවනය නොකරන්නාවූ සත්වයා ධර්මයෙහි බහුශ්‍රැත වූ පුද්ගලයා කරා පැමිණ ඔහුගේ බස් නොඅදහන්නේය. අර්ථානර්ථ කාරණා පරීක්ෂා නොකිරීමෙන් ප්‍රඥා විශේෂයකට නොපැමිණෙන්නේය. යම් සත්වයෙක් දශකුශල කර්මපථ විභාගයෙහි දක්ෂවූයේද වීර්‍යකරන්ට සුදුසු තැන්හි වීර්‍ය කෙරේද නුකුසිතව ඒ ඒ කරන්ට නිසිතැන්හි ඒ ඒ කාරි කෙරේද එසේ වූ පුද්ගලයා හට කර්මඵල සමෘඩ වන්නේය. ලාභ, යශ, සුඛාදීන්ට ආදර කරවූ, දුශ්ශීල ක්‍රියාවන් යුක්තවූ පුද්ගලයන් සේවනය කරන්නාවූ කුශලකර්මපථය කරන්නාවූ කාලයෙහි කළකිරී උකටලීව කරන්නාවූ මෙබඳු පුද්ගලයාට කර්මවිභාග සිදු නොවන්නේය. දිව්‍ය ලෝකෝත්පත්තිය නොවන්නේය. අනිත්‍ය භාවනාවූ පුද්ගලයා හට කර්මවිපාකය සමෘද්ධ වන්නේය. මහත් ඓශ්චර්‍යයටත් පැමිණෙන්නේය.

දේවයන් වහන්ස, යෙදිය යුතු කාරණයෙහි යෙදීමේ සංඛ්‍යාත වූ ප්‍රඥා කොට්ඨාශයද රැස්කරන ලද වස්තුව රක්ෂාකිරීමද යන මේ දෙක හා පළමු මා විසින් කියන ලද සියළු කාරණයන් සේවනය කළ මැනව. මා කී අවවාද සිතේ තබාගෙන නුඹ වහන්සේගේ මාළිගයේ වස්තුව රකිමින් ජීවත්වුව මැනව. නිස්කාරණයේ වස්තු නොනැසුව මැනව. නුවණැත්තාවූ පුද්ගලයා නිස්කාරණයේ සියළු වස්තුව නසා පසුව දුගී

බවට පත්වන්නේය. ජීවිත හානි පවා වන්නේය. නැතිකර ගන්නේය. මෝඩ සත්වයා නිස්කාරණයේ වස්තුව නසා නිරයෙහි ඉපිද මහත් දුක් අනුභව කරන්නේ, යයි මෙසේ මහ බෝසතාණන් වහන්සේ මෙතෙක් කාරණයෙන් පංචවිධ බලයන් වර්ණනාකොට ඒ සියළු බලයන්ට වඩා බලවත් ගාථා දහයකින් අවවාද දෙන්නාවූ මෙසේ පැවසීය.

උදෑසනම නැගිට දෙමාපියන්ට නිතිකළමනා උපස්ථාන කොට අවුලුපත් පිරිසිඳු ඇඳුම් ආදියෙන් සරසා පරිහරණය කරන ලද ඇඳුම් පිළි සෝදා තබා ශරීර පරිහරණය කරමින් මාතෘ, පීතෘ උපස්ථාන කරන්නාවූ නුඹ වහන්සේ ධර්මයෙහි හැසුරුණ මැනව, දේවයන් වහන්ස, දෙමාපියන්ට උපස්ථාන කිරීම් කුශලධර්මය මිනිස් ලෝකයේදී කොට පරලොව ස්වර්ගමොක්‍ෂ සම්පත්තියට උත්සහා කළ මැනව, රජතුමනි, දරුවන් පාපක්‍රියාවලින් වළකා කුසලෙහි පිහිටුවා ශිල්ප උගන්වා වැඩිවිය පැමිණි කල්හී සුදුසු කාලයෙහි අවාහ විවාහකොට උනුණුන්ට තිබෙන වස්තු දීමෙන් දරුවන් කෙරෙහි හැසුරුණ මැනව. සාමාන්‍ය අන්තඃපුර ස්ත්‍රීන්ට සහ බිසෝවරුන්ට සම්මාන කරමින් උන් ඉක්ම නොපැවත, සියළු ඓශ්වර්ය්‍ය උන්ගේ පාලනයට හරිමින් උතුම් වූ වස්ත්‍රාභරණදිය දෙමින් අග්‍ර මහේෂිකාවන් හා අන්තඃපුර ස්ත්‍රීන් කෙරෙහි ධර්මයෙහ හැසුරුණ මැනව.

දේවයන් වහන්ස, සියළු විශ්වාසයෙන් හා අමාත්‍යයන් අවශේෂ වූ සියළු සත්වයන්ට දාන , ප්‍රිය වචන, අර්ථචර්‍ය්‍යා, සමානාත්මතා යයි කියන ලද සතරසංග්‍රහ වස්තුවෙන් සංග්‍රහ කරමින් මටසිළුටු වූ ප්‍රියතෙපුල් බෙනෙමින්, පරුෂවාක් නොකීමෙන්, මුසාවාදාදී වූ චතුර්විධ දුශචරිතයෙන් සියලු ජනයා නොසටා ඔවුන් කෙරෙහි ධර්මයෙහි හැසිරුණ මැනව, දේවයන් වහන්ස, ඇත්, අස් වාහනයන්ට හා සේනාවට දියුයතු වැටුප් වියදම් ආදිවූ සියල්ල දීමෙන් සත්කාර, සම්මාන කිරීමෙන්ද, ඇත්, අස්, ගව, මහීෂාදි වැඩගත් සත්වයන් වයසට පැමිණෙන විට ඔවුන්ගෙන් වැඩ නොගෙන කළ සේවයට සරිලනසේ ඇප උපස්ථාන කළ මැනව, ගම්, නියම් ගම් වාසීන්ට තාඩන පීඩාදී වූ මර්ධණය හා නොමඟ අයපඬුරු ගැනීම් ආදියෙන් පීඩා නොකරන්නාවූ ඔබ වහන්සේ එම වැසියන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව, රාජ්‍යවාසීන් හා ජනපද වාසීන්ට නිස්කාරණයේ පීඩා නොකොට ඔවුන් වෙත වෛරසිත නොයොදවා ජනපීඩා නොකොට සියළු සත්වයන් කෙරෙහි මෛත්‍රී පතුරුවන්නාවූ ඔබ වහන්සේ රට වැසියන් කෙරෙහි

ධර්මයෙහි හැසුරුන මැනව, ධාර්මිකව ශ්‍රමණ බ්‍රහ්මණයන්ට චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍යයයි කියන ලද චතුර්විධ ප්‍රත්‍යය දීමෙන් ඔවුන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව. පියාණන් වහන්ස, සියළු මෘග ශූකරාදිවූ සිවුපාවුන් හා පක්ෂීන්ට අභය දීමෙන් ඔවුන් කෙරෙහි මෛත්‍රිය වඩව මැනව.

සාමාන්‍යයෙන් සියළු සත්වයන් කෙරෙහිම මෛත්‍රී කිරීමෙන් මොවුනුත් මාගේ පුරවැසියෝය, ඔවුන්ගේත් ආරක්‍ෂකයා මමය, භාරකාරයාත් මමය සිතා ක්‍රියාකරනු මැනව. මනාකොට පුරුදු කරන ලද්දාවූ දාන, ශීලාදිවූ සමචර්‍ය්‍යා, සංඛ්‍යාතවූ කුශල සදිව්‍ය ලෝකයෙහි උපදවා මහත්වූ දිව්‍ය සම්පත් අනුභව කල මැනව. පියාණෙනි, ශක්‍ර දේවේන්ද්‍රයන් ප්‍රධාන කොට ඇති දෙවියන් හා සහම්පති මහා බ්‍රහ්මයා ප්‍රධාන කොට ඇති සියළු බ්‍රහ්මයෝ මනුෂ්‍ය ලෝකයෙහිදී කරණ ලද්දාවූ කාය සුචරිතාදීවූ උත්තම සුචරිතයෙන් දිව්‍ය බ්‍රහ්මලෝක සංඛ්‍යාත වූ සවර්ගයට පැමිණ එහි යසස් සමෘද්ධිය අනුභව කරන්නාහ. එනිසා මපියාණෙනි, නුඹ වහනසේ ජීවිත පරිත්‍යාග කොටත් කුශලකර්මයෙහි අප්‍රමාදවූව මැනව, යි මෙසේ දසවිධවූ රාජධර්මය කියා මත්තෙහිත් අවවාද කරන්නාවූ මහ බෝසතාණන් වහන්සේ මෙසේ කීහ.

''මපියාණන් වහන්ස, නුඹ වහන්සේ මා විසින් කියන ලද්දාවූ අවවාදය සිත තබාගෙන හැමකල්හිම නුවණැත්තා වූ සත්වයන් සේවනය කොට කල්‍යාණ ගුණයෙන් සමන්විත වූ සියළු කාර්‍ය්‍යාකාර්‍ය්‍ය ප්‍රත්‍යක්‍ෂ කොට දන සියළු රාජධර්මයන් සම්පූර්ණ කොට ඉගෙන මාවිසින් අවවාදානුශාසනාවූ පරිද්දෙන් පිළිපැද්ද මැනව,යි.'' මෙසේ මහ බෝසතානෝ සර්වඥ විලාශයෙන් රජතුමාට ධර්මය දේශනා කලාය. රැස්ව සිටි ජනතාව බොහෝ සෙයින් සතුටට පත්ව වස්ත්‍රාභරණයන් පූජා කොට බොහෝ සත්කාර, සාධුනාද කළහ.

ඉක්බිති රජතුමාත් බොහෝ සතුටට පත්ව අමාත්‍යයන්ගෙන් අදහස් විමසූහ. එවිට සියළුම ඇමතියන් ඉල්ලා සිටියේ දේවයන් වහන්ස, සෙනෙවිරඳුන් විසින් කළමනා දෙය කරන්ට සුදුසු යයි කී කල්හි එසේනම් මපුතුණුවන් වූ ජම්බුක පණ්ඩිතයන් වහන්සේට මෙතැන් පටන් සෙනෙවිරත් තනතුර පවරමි, යි කියා එම තනතුර භාර දුන්හ. එතැන් පටන් එම තනතුරේ කාර්‍ය්‍යභාරයත් පිය රජතුමාට වෙනත් කළ යුතු කාර්‍ය්‍ය භාරයත් මැනවින් කළහ. පක්ෂීන් තුන් දෙනාට මහත්වූ

සත්කාර සම්මාන විය. රජතුමා ආයු කෙළවර මරණින් පසු සමගී ලෝකයෙහි උපන්හ. අමාත්‍යයෝ ආදාහන කටයුතු අවසානයේ පක්ෂීන් තුන්දෙනා කැඳවා රජතුමාගේ අවසාන කැමැත්ත අනුව ජම්බුක පඬිතුමාට රාජ්‍යය කරන ලෙස ඉල්ලා සිටියේය. එපවත් අසා එතුමා කියා සිටියේ, මා තිරිසන්ව සිටින නිසා මනුෂ්‍ය රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත. තෙපි සැවොම අප්‍රමාදයෙන් රාජ්‍යය කරව, යි කියා සියල්ලන්ටම පඤ්චශීලය පිහිටුවා තුන්දෙනාම වනයට ගියහ.

ජම්බුක පණ්ඩිතයන්ගේ අවවාද අනුශාසනා අවුරුදු හතළිස් දහසක් පුරා පැවතුනේය. ශාස්තෘ වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් පසේනදි කොසොල් මහ රජතුමාට අවවාද වශයෙන් මෙම ධර්මදේශනාව වදාරා මෙසේද වදාරණ සේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් දූන් ආනන්ද ස්ථවිරයෝය, කුණ්ඩලා නම් දූන් උප්පලවන්න ථෙරිය, වෙස්සන්තර පක්ෂියාණන් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, ජම්බුක පඬි නම් බුදුවූ මම්ද වේදෑ' යි තමන් වහන්සේ ද දන්වා වදාළ සේක.

**තෙසකුණ ජාතකය නිමි.**

**මෙය සංස්කරණය කරණ ලද්දේ 18.10.2010 උතුරු කළුතර ශ්‍රී කල්‍යාණ ධර්මා ශ්‍රමයෙහිදීය. නැවත පිටපත් කරන ලද්දේ 11.09.2014 ගල්දූව ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රමයේදීය.**

**නමො තසස භගවතො අරහතො සමමා සම්බුදධසස !!!**

## <u>පසුවදන</u>

මෙම ජාතක කථා වස්තුව පන්සිය පණස් ජාතක කථා පොත් වහන්සේට ඇතුලත් කථා වස්තුවකි. මෙම කථා වස්තුව කියවීමෙන් යම් කොටසක් කථා වස්තුව කෙරෙහි විචිකිච්ඡාවක් ඇතිකර ගැනීමෙන් නීවරණය නොහොත් නිවණට මාර්ගය අසුරා ගන්නේය. ඒ මන්ද යත් ඃ- එක කුරුළු කූඩුවක තුන් වර්ගයක පක්ෂීන් තුන්දෙනෙක් බිත්තර දමන්නේ කෙසේද ? එයට පිළිතුරු රජතුමාට බිත්තර පරීක්ෂාකර බැලූ අවස්ථාවේම නිවරුදි පිළිතුර ලැබුණි. දෙවන ප්‍රශ්නය වූයේ වර්ග තුනේම එක එක බිජු තිබීමත් තුන්වැනි ප්‍රශ්න වූයේ රජතුමා දෙවියන්ගෙන් දරු සම්පත් ඉල්ලා නොලැබීමත් සහ එය සිහිපත්වී දෙවියන්ගේ දේවානුභාවයෙන් ක්‍ෂණයකින් රජතුමාට දරු සෙනෙහස එම බිජුවට ඉපදීමත්, ඒ තමයි මට ලැබෙන පින්වත් දරුවන් බුද්ධිමත් දරුවන් යන හැඟීම උඩ අමාත්‍යයන් තුන්දෙනෙකුට රාජකාරි කටයුත්තක් ලෙස ඒවා ආරක්‍ෂා සහිතව රැක පැටවුන් රජතුමාට ඉදිරිපත් කිරීමට නියෝග කිරීම.

හතරවන ප්‍රශ්නය එම බිත්තර බිඳී පැටවුන් මෙලොව එළිය දුටුකල වැද්දන් ලවා ස්ත්‍රී පුරුෂභාවය හඳුනාගෙන රජතුමා වෙත ගෙනගිය පසු ඔවුන්ට සුදුසු නම් තබා ඔවුන් භාර ඇමතියන්ට බොහෝ තෑගි භෝග දී යැව්වේ මොවුන් මාගේ දරු පුරප්පාඩුවට පිරවීමත්, සසර ගමනේ එන ඥාතිහිතයිශි වීමත් පින්වත් රජතුමා අවබෝධවී තිබුණු නිසා තමයි දරුවෝ තුන්දෙනාට මාගේ වෙස්සන්තර පුතා, කුණ්ඩලී දියණිය, ජම්බුක පුතා ආදී නම් කියවන විට ඇමතියන් එය විහිළුවට ගෙන වනයේ වසන පක්ෂීන්ට දරුවන් නැති නිසා දරු නාමයෙන් ආමන්ත්‍රණය කරන්නනේ කියා රජමාළිගයේ සැමටම තිබුණ අවතක්සේරුව බිඳහෙළන්නට සමර්ථ වූයේ ඒ එදා.

මේ මෙදා, වර්තමානයේ ආයුෂ බොහෝ සෙයින් අඩුවී තිබෙන (76) පාපය බලවත් වී තිබීම, කාමරාගය අධිකවී තිබීම, ලෙඩ රෝග

බහුලව තිබෙන රස අතුරුදහන්වී තිබීම, රජදරුවන් (පාලකයින්) අධර්මිෂ්ඨව සිටින ඊෂ්‍යාව, ක්‍රෝධය, වෛරය, මාන්නය, පළිගැනීම, ආත්මාර්ථකාමීත්වය ඉහවහා ගොස් තිබෙන පව, පිණ, ලජ්ජා, භය නැති තත්වයට පත්ව තිබෙන සමාජය හොබවන ඉහල පෙලේ සිට පහත දක්වාම මෙවැනි දහම් කථා පිළිගන්නේ මනඃකල්පිත කථා, රස කථා, ආදී වශයෙනි. එයද බුඬ ධර්‍මය කෙරෙහි ඇති කරගන්නාවූ විචිකිච්ඡාව නිසා තමන් නොදනුවත්වම පඤ්චානන්තරි පාපකර්‍මයටත් වඩා භයානක මිත්‍යදෘෂ්ටීන් වී සතර අපාගත වීමත් කල්ප විනාශයේදීත් පිටසක්වළ නිරයන්ද, ලෝකාන්තරික නිරයන්ද උත්පත්ති ලබා දුක්සසර ගමන තවත් කිවනොහැකි කාලාන්තරයකට දීර්‍ඝකර ගැනීමයි.

නොමඟ නොයන් පුතේ, නුඹට රටක් ඇතේ, මෙයින් මා කියන්නේ රටත්, ජාතියත්, ආගමත්, පක්‍ෂයක් ගැන නොවෙයි. මහා කල්ප සතර අසංඛ්‍යයකුත් තවත් කල්ප ලක්‍ෂයකුත් යනු එසේ මෙසේ කාලාන්තරයක් නොවෙයි. එය උපමා කිරීමට අවශ්‍ය නැත.ඒනිසා අතිදීර්‍ඝ ගමනක් බුදුබව පතා ගෙන එනවිට මෙවන් ජාතක කථාවස්තූන් නිමක් නැතිව තිබෙන්නට ඇත. අද බොහෝ සෙයින් දියුණුයි කියන සිතන නවීන විද්‍යාවත් අවුරුදු සීයෙන් සීයට එනවිට තිබුණු විද්‍යාව ඉවත්කර අළුත් (නවීන) විද්‍යාව නවීකරණය වේගෙන ආවත් එම නවීන විද්‍යාවත් මෙයට අවුරුදු 2600 කට ඉහත දේශනා කරන ලද බුදුදහමත් ප්‍රතික්ෂප වෙනවා වෙනුවට දිනෙන් දින බුදුදහමේ සත්‍යය පිළිගැනීමට පවා විද්‍යාඥයෝ පෙළඹී සිටිති.

ඔරලෝසුවේ කටු දෙක නිරන්තරයෙන් ගමන් කරන ආකාරයට සංසාරගත සත්වයාගේ පව පිණ අනුව ආයුෂ වර්‍ධණය වීමත්, ආයුෂය ගෙවීමත් වන්නේය. ඒ අනුව ඒසා අතිදීර්‍ඝ කාලාන්තරයක් පුරා සිත තිබෙන සතුන් පමණක් නොව සිත නැති, පණ ඇති වෘක්‍ෂලතාදිව අදහස් හුවමාරු කරගත්තා කියා තිබුණොත් (එවැනි දෙයක් නැත) එයත් පුදුමවිය යුතු දෙයක් නොවේ යනු මගේ අදහසයි.

එමනිසා පින්වතුනි බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වන්නේ අතිදීර්‍ඝ කාලයකට පසුව දුක්සසර සැරිසරණ සත්වයෝත් දුකින් මුදවා තමන් වහන්සේ සසර ගමන නිමාකර ගැනීමේ පරම චේතනාවෙන්මය. එනිසා සකල සත්වයා වෙත පතල මහා කරුණාවෙන් දේශනා කරන ලද ධර්‍මය නිවරදිය. අපට එය අවබෝධ

කර ගැනීමට ඥාණය මඳය කියා සිතනවා හැර කිසි ආකාරයකින්වත් විචිකිච්ඡාවක් උපදවා නොගත යුතුය. එය නීවරණය වීමෙන් බලවත් අකුසලයක් බවට පත්කර නොගෙන මේ ඉතා දුක සේ ලබාගත් මිනිසත් භාවයත් සම්බුද්ධ ශාසනයත් පිහිටාධාර කරගෙන දිවා රාත්‍රි ශක්ති ප්‍රමාණයෙන් කුසල් දහම් රැස්කරගන්න. නිති පඤ්ච ශීලයම ආරක්‍ෂා කර ගන්න. ප්‍රාණඝාතයෙන් පමණක් නොව එයට අනුබල දීමෙන්ද වළකින්න. එයත් ධර්මදානය මෙන්ම අභය දානය සේම ස්වර්ග මොක්‍ෂ සම්පත්තිය පිණිසම හේතු වනවා ඇත.

**ආචාර්ය සරත් අමුණුගම**
**(2011 ජනවාරි 2 ඉරිදා - ලක්බිම)**

**ශ්‍රීමත් සිරිල් ද සොයිසා මැතිතුමා හඳුනාගැනීමේ මහඟු වරප්‍රසාදය කළුතර කච්චේරියේ සේවය කළ තරුණ සිවිල් සේවකයකු වශයෙන් මට ලැබුණි. මාගේ හඳුනාගැනීම තුළ ඔහු විශිෂ්ට ජාතික පුත්‍රයෙක් ද ආගමික වීරවරයෙක්ද විය. එතුමන්ගේ උද්‍යෝග පාඨය වූයේ "සමාජයට අහිතකර බලපෑමක් ඇති වන්නේ පුද්ගලයා අවංක වන විට නොව ඔහු වංක වන විටය. රටට අහිතකර බලපෑමක් ඇති වන්නේ ඔහු නිකරුණේ කල් ගතකරන විට පමණ" යනුවෙනි.**

ශ්‍රීමත් සිරිල් උපත ලද්දේ සියවස් තුනක යටත්විජිත පාලනයකින් පසුව දීර්ඝ කාලයක් තිස්සේ ඇතිවී තිබූ අකර්මණ්‍ය තත්වයකින් බෞද්ධයන් ක්‍රමයෙන් මුදාගැනීමෙන් පැවති යුගයකය. දිවයිනේ බෞද්ධයන්ගේ මූලික අයිතිවාසිකම් රාශියක් මෙන්ම ඔවුන්ගේ ආත්ම ගෞරවය ද ඔවුන්ට දිගින් දිගටම අහිමි වෙමින් තිබුණි. ජාතියේ මතකයෙන් කිසිදා මැකී නොයන බෞද්ධාගම නැවත බේරාගැනීමේ කාර්යය වීරෝධාර පෞරුෂත්වයෙන් යුත් මිනිසුන් විසින් සාර්ථකව අරඹන ලදී. ඔවුන් නම් අනගාරික ධර්මපාලතුමා, මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි, හෙන්රි ස්ටීල් ඕල්කට් මැතිතුමා, ශ්‍රී සුමංගල හිමි, හරිස්චන්ද්‍ර වලිසිංහ තුමා ඇතුළු අනෙකුත් වීර පුතුන්ය.

ශක්තිමත්භාවයෙන් හා උද්‍යෝගයෙන් පිරිපුන් තරුණ සිරිල් බලපිටියෙන් සංග්‍රාමයට අවතීර්ණ වූයේ හරියටම මේ යුගයේදීමය.

මේ කාලය වන විට කළුතර ප්‍රදේශයේ බුද්ධාගම පැවතියේ ඉතා පහත් අඩියකය. බෞද්ධ දෙමාපියන්ගේ දරුවන් සඳහා ප්‍රදේශයේ පාසල් නොතිබිණි. සියවස් 4 කට 5 කට පෙර කළු ගඟ අසබඩ ඉදිවී තිබූ ගංගාතිලක විහාරය නමින් සුපතළ මනරම් විහාරය ආක්‍රමණික පෘතුගීසි හමුදාව විසින් පොලවට සමතලා කරනු ලැබ තිබූ නිසා වන්දනා කරුවන්ට සිය වැඳුම් පිදුම් සඳහා සුදුසු ස්ථානයක් තිබුණේ නැත. කඳුගැටය මුදුනේ පිහිටි එකම බෝධි වෘක්ෂය ආරක්ෂා වී තිබුණත් එය පැවතියේ අත්හැර දමන ලද තත්වයකය. මෙම ඓතිහාසික පුදබිම ආරක්ෂා කිරීම සඳහා ශ්‍රීමත් සිරිල් ද සොයිසාගේ අප්‍රතිහත ධෛර්යයේ ප්‍රථලයක් වශයෙන් 1951 නොවැම්බර් 7 වැනි දින කළුතර බෝධි භාරය

පිහිටුවන ලදී. එහි අරමුණ වූයේ මේ පූජනීය ස්ථානය ආරක්ෂා කිරීමය.

සිය පෞද්ගලික ධනය වියදම් කරමින්ද රටේ තිබෙන ඉතාම වන්දනීය ආගමික ස්ථානවලින් එකක් බවට එතුමා මේ පූජනීය ස්ථානය පරිවර්තනය කළේය. එවකට කළුතර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යාලය පිහිටියේ මෙම පුදබිම තුළය. එබැවින් බෝධි පරිශ්‍රය සංවර්ධනය කිරීමට සහ යථා තත්වයට පත් කිරීමට හැකි වන පරිදි අලුත් තැනකට ආණ්ඩුවේ ඒජන්ත කාර්යාලය ගෙනයෑම සඳහා ආණ්ඩුව කැමති කරවා ගැනීමට ශ්‍රීමත් සිරිල්ට හැකි විය.

අනතුරුව එතුමා එම භූමිය තුළ ලංකාවේ ඉංජිනේරු තාක්ෂණයේ ආශ්චර්යයක් බඳු වූ මැද කුහරය සහිත චෛත්‍යක් සෑදීමේ සැලැස්ම ක්‍රියාවට නංවන්නට විය. එවකට මහත් ප්‍රසිද්ධියට පත්ව සිටි ඉංජිනේරු වෘත්තියකු වූ විද්‍යාජෝති ආචාර්ය ඒ.එන්.එස්. කුලසිංහ මහතාණෝ එම විස්මිත ඉංජිනොරු නිර්මාණය යථාර්ථයක් කළහ.

පෙරසවි කොන්ක්‍රීට් රාමුවක් මත ඉදිකරන ලද චෛත්‍ය අඩි 95 ක විෂ්කම්භයකින් ද අඩි 300 ක පරිධියකින් ද යුක්ත විය. මේ සුවිසල් ඉදිකිරීම සඳහා 1964 දී පදනම දමන ලද අතර වසර දහයක ඉදිකිරීම් කටයුතුවලින් පසු 1974 මාසයේදී චෛත්‍යයේ කොත පැළඳවීම සිදුකරන ලදී.

1980 පෙබරවාරි 28 වන දින කොත නිරාවරණ ක ධාතු ගර්භයේ ධාතු නිදන් කිරීම සිදුකරන ලදී. අද කළුතර නගරයට පිවිසෙන ස්ථානයේ තේජවන්ත හ චිත්තාකර්ෂණීය දසුනක් මවමින් ඒ චෛත්‍ය රාජයාණන් දිස්වේ.

ශ්‍රීමත් සිරිල්ගේ නම මූලික වශයෙන්ම කළුතර බෝධිය හා සම්බන්ධ වූවත් බෞද්ධාගමේ තිර පැවැත්ම උදෙසා එතුමාගෙන් ඉටු වූ සේවය බොහෝ අංශවල පැතිරුණු ප්‍රබල එකක් විය. බොහෝ බෞද්ධ සිද්ධස්ථාන, පුදබිම් හා ආයතන එතුමාගේ ත්‍යාගශීලීත්වයෙන් පෝෂණය ලද අතර කතරගම කිරි වෙහෙර සහ එහිම වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යයේදී ද එතුමා පුරෝගාමී විය. බෙල්ලන්විල රජමහා විහාරය, කුප්පියාවත්ත ජයශේඛරාරාමය, පින්වත්තේ සද්ධර්මාකාර පිරිවෙන යන පූජනීය

ස්ථාන සංවර්ධනය කිරීම සහ පොළොන්නරුවේ විශ්‍රාම ශාලාවක් ඉදිකිරීම ද ශ්‍රීමත් සිරිල්ගේ ත්‍යාගශීලි ක්‍රියා වන්හී උතුම් ඵලයන්නය.

බෞද්ධ පරිසරයක් තුළ කළුතර දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ දැඩි කැමැත්තක් ශ්‍රීමත් සිරිල් තුළ විය. ඒ අනුව, අද කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රමුඛ පෙළේ ගැහුණු ළමයින් සඳහා වන කළුතර බාලිකා විද්‍යාලයත්, පිරිමි ළමයින් සඳහා වන කළුතර විද්‍යාලයත් එතුමා ආරම්භ කළේය. කළුතර බාලිකා විද්‍යාලය මුලින්ම ආරම්භ කරනු ලැබුවේ 1942 එතුමාගේම නිවසේය.

එවක අභාවයට යමින් තිබුණු ලන්ඩන් බෞද්ධ විහාරයද ශ්‍රීමත් සිරිල් විසින් නැවත යථා තත්වයට පත් කරන ලදී. ලන්ඩනයේ ඔවින්ග්ටන් උද්‍යානයේ සිවු මහල් ගොඩනැගිල්ලක් වසර දහයකට බද්දට ගනිමින් එතුමා ඒ සඳහා පෙරමුණ ගත් අතර 1954 වෙසක් මාසයේදී ඒ විහාරය නැවත විවෘත කරන ලදී. සම්පූර්ණ වසර දයහක් සඳහා පවුම් 700 ක් වාර්ෂිකව බඳු කුලියේ වගකීම ශ්‍රීමත් සිරිල් විසින්ම බාරගනු ලැබීය.

දුරදක්නා නුවණින් යුත් ශ්‍රීමත් සිරිල් සිය විශිෂ්ටත්වය ප්‍රදර්ශණය කළ තවත් ක්ෂේත්‍රයක් වූයේ සිය සහෝදර රට වැසියන්ට උපකාරී වීමේ ඉතාම ඵලදායී මාර්ගය වශයෙන් එතුමා අවබෝධ කර ගත් රැකියා සම්පාදනයයි. මෝටර් රථ බැටරි, බයිසකල් ටයර් සහ ටියුබ් නිෂ්පාදනය සඳහා විශාල කම්හල් සමූහයක් දකුණු කළුතර ඉදිකළ එතුමා ඉන් පසුව, මහා පරිමාණයේ ටයර් නැවත පිරවීමේ ක්ෂේත්‍රය දක්වා එය ව්‍යාප්ත කළේය. ඉන්පසුව විදුලි රැහැන් හා ශීතකරණ නිෂ්පාදන ව්‍යාපාරය ආරම්භ කරන ලද අතර කළුතර අවට ගම්වාසීන් දහස් ගණනකට ඒ කම්හල් වල රැකියා අවස්ථා උදාවිය. ශ්‍රීමත් සිරිල් ආරම්භ කළ හැම ව්‍යපෘතියක්ම තමන්ගේම සම්පත් උත්පාදනය කරන බවටත් සම්පූර්ණයෙන්ම ස්වයංපෝෂිත වන බවටත් සහතික වීමට එතුමා කටයුතු කළේය.

ශ්‍රීමත් සිරිල්ගේ බස් සමාගම ජනසතු කිරීම ජාතිවාත්සල්‍යය පිලිබඳ එතුමා සතු වූ විශාල හැඟීම ප්‍රදර්ශනය කළ අවස්ථාවක් විය. ඒ ඉරණමට මුහුණ දුන් අනෙකුත් සමාගම් හිමියන් තමන්ගේ වාහන ලංකා ගමනාගමන මණ්ඩලයට භාර දීමට පෙර ඒවායේ තිබූ අලුත් ටයර් ආදී

කොටස් ගලවා ගැනීමට වගබලා ගත් නමුත්, ශ්‍රීමත් සිරිල් තම කාර්ය මණ්ඩලයට උපදෙස් දුන්නේ තමාගේ සියලුම බස් රථ භාරදීමට පෙර ඒවාට අලුත්ම ටයර් සහ ටියුබ් දමා, ඉන්ධන ටැංකි පුරවා භාර දෙන ලෙසය.

අවුරුදු 19 ක් සභාපති වශයෙන් හිඳිමින් කොළඹ තරුණ බෞද්ධ සංගමය, බෞද්ධ පරම විඥානාර්ථ සමාගම, කළුතර බෞද්ධ සංගමය, වැඩිහිටි නිවාසය මෙන්ම ළමා නිවාසය සම්බන්ධව ශ්‍රීමත් සිරිල් ද සොයිසා ඉටුකළ කාර්යයන් නිසාද එතුමාගේ නම සිහිපත් කරනු ලැබේ. මේ සියළු කටයුතු එතුමා මහත් උද්‍යෝගයකින් යුතුව ඉටු කළේය.

අද ශ්‍රීමත් සිරිල් ද සොයිසා ජීවතුන් අතර නැත. එතුමා බෞද්ධ ජීවන මාර්ගය අනුව සිය ජීවිතය ගත කළේය. 1896 ඔක්තොම්බර් 26 වන දින උපත ලත් එතුමා වයස 82 ක් තරම් දීර්ඝ ආයුධ විඳ 1978 ජනවාරි 2 දින අභාවප්‍රාප්ත විය. එතුමා සිය ජීවිතයේ සන්ධ්‍යා භාගයේදී ගැඹුරු අධ්‍යාත්මික ශාන්තභාවයකට පත්වී සිටියේය. එවන් අවස්ථාවක එතුමාගේ වදන්වලින් පළ වූයේ බෞද්ධ ජීවන මාර්ගයේ හරයයි. ''මම දැන් නිදහස්ය. ඔබ කොතරම් පොහොසත්ද යන්න වැදගත් දෙයක් නොවේ. ඒවා සියල්ල ඔබ මුලා කරන සුලුය. කිසිඳු ධනයක් නොමැතිව මම මියයන්නෙමි. මගේ සැනසුමද, සතුටද, ශක්තියද වන්නේ බුද්ධ ධර්මයයි'' මේ එතුමා පැවැසූ අයුරුය.

ශ්‍රීමත් සිරිල් ද සොයිසා මැතිතුමන්ගේ බෑණාවරුන් වන කළුතර බෝධි භාරයේ සභාපති අජිත් ද සොයිසා සහ එහි ගරු ලේකම් දේශබන්දු තිලක් ද සොයිසා යන මහත්වරුන් විසින් ශ්‍රීමත් සිරිල් ද සොයිසාගේ දර්ශනය වඩා ඵලදායී හා කාර්යක්ෂම ලෙස දැන් ඉදිරියට ගෙනයමින් පවති. එහි අනෙකුත් භාරකරුවන් වන්නේ දේශබන්දු ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි, ජනාධිපති නීතිඥ වරුණ බස්නායක මහතා, චිත්‍රා මෙන්ඩිස් මහත්මිය, අශාන් ද සොයියා මහතා, සහ විවේන්ද්‍ර ලින්තොටවෙල මහතා යන අයයි.

ශ්‍රීමත් සිරිල් ද සොයිසා මැතිතුමාගෙන් අප ලද ශ්‍රේෂ්ඨ දායාදය වන්නේ එතුමාගේ ශ්‍රමයේ, දර්ශනයේ සහ එක් අරමුණකට යොමු වී තිබීමේ ප්‍රතිඵල අද එහි අවසන් ප්‍රතිලාභීන් වන ශ්‍රී ලාංකික ජනතාවට භුක්ති විඳීමට හැකි වී තිබීමය.

## බිත්තර කෑමෙන් වැළකී සිටින්නේ නම් යෙහෙකි...

**ප්‍රශ්නය ඃ-**

කිකිළි බිත්තර කෑමෙන් පව සිදුවෙනවා යන කවුරුත් දනි. නමුත් ගොවිපල වල ඇති කරන කිකිළියන් ගේ බිත්තර වල ජීවයක් නැතැයි සමහරු කියති. මීට හේතුව එම සතුන් ලිංග භේදය අනුව වෙන් වෙන් වශයෙන් සකස් කොට හදන නිසාලු. එමනිසා ගොවිපල වල ඇති කරන සතුන්ගේ (කිකිළියන්ගේ ) බිත්තර කෑමෙන් පාපයක් ඇති වේද ? පහදා දෙන්න.

ඩබ්. ඩී. පියරත්න (වෛද්‍ය පාර, දෙහිවල)

**පිළිතුර ඃ-**

මජ්ජිම නිකායේ සිහනාද සූත්‍රයේ දැක්වෙන අයුරු අණ්ඩජ, ජලාබුජ, සංසේජ ,ඕපපාතික යයි සත්වෝත් පත්ති ක්‍රම සතරකි. බිජු වටෙහි වැඩෙන්නෝ අණ්ඩජය, වැදෑමහේ වැඩෙන්නෝ ජලාබුජය, දහදිය කැළිකසළ වැනි දේහි වැඩෙන්නෝ සංසේජය, මව් පියන්ගේ සම්බන්ධයක් නැතිව ඇතිවන්නෝ ඕපපාතිකය. විද්‍යාවට අනුවද අණ්ඩජ, ඛණ්ඩජ වශයෙන් දෙයාකාරය. බිජුවෙහි උපදින්නෝ අණ්ඩජය. දෙකට දෙකට කැඩී කැඩී උපදින බැක්ටීරියා, හිද්‍රා වැනි ඒක ශෛලීය සත්වයෝ ඛණ්ඩජය. මේ අනුව හැම සත්වයෙකුගේම ඉපදීමට මව් පිය දෙදෙනාගේ සම්බන්ධයක් අවශ්‍ය නැත. මේ සම්බුදු දහමෙහිද ජීව විද්‍යාවේ ඉගැන්වීම් වලට අනුවයි ඔබගේ ප්‍රශ්නය විසඳා ගත යුතු වන්නේ.

කුකුළාගෙන් තොරව කිකිළියන් පමණක් සිටින කුකුළු කොටුවක සිටින කිකිළියක දැමූ බිත්තරයක් රැක්කවීමෙන් පැටිවෙකු බිහි නොවන බව පරීක්ෂණයන් ගෙන් තහවුරු වේ. එයට හේතුව එම බීජව පුරුෂ ප්‍රජනක ශෛලයක් ශුක්‍රාණුවක් සමඟ සංසේජනය නොවීම නිසාය. පාම් බිත්තරත් එවැනි බිත්තරය.

ස්ත්‍රී පරාගයකින් පමණක් ගෙඩියක් හට නොගනී. ස්ත්‍රී පරාග පුරුෂ පරාග සමඟ වන සංසර්ෂණයෙන්ම ගෙඩි හට ගනී. ඒ පරාග සර්ෂණයෙහි ලා සමනල ආදී සත්තු මහත් සේවයක් කරත්. සමහරවිට

පුරුෂ පරාගය එහි හෝ අන්‍යයෙකු විය හැකිය. මේ ශාඛා ජීවින්ගේ පැවැත්මටද ස්ත්‍රී පරාග පුරුෂ පරාග දෙකම අවශ්‍යය.

ඉහත දැක්වූ කරුණු කෙසේ වුවත් බිත්තර බිඳ නොකැවට කන්නට ඕනෑ තරම් දේවල් තිබේ.

**පස්ගෝ....**

**ප්‍රශ්නය ඃ -**

පස්ගෝ රස යනු මොනවාදයි අනුපිළිවලින් දක්වන්න

මිරඟවත්තේ රතනපාල හිමි,
පුරාණ රජ මහ විහාර,
දඹවින්න,
වැලිමඩ.

**පිළිතුර ඃ-**

කිරි, දී, ගිතෙල්, වෙඬරු, මෝරු යන මේවාහු පස් ගෝ රසය.

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,
ගුණරත්න යෝගාශ්‍රමය,
තල්වත්ත (කැළණිය)
ගෝණවල.

# මාළුවකුගේ අඳෝනාව

පෙර අත්බවයකදී කළ පව් පල දී ලා
මා ඉපදුනා සමුදුර තෝරෙක් වී ලා
හැඩි දැඩි මිනිසුන් වටකොට දැල් දා ලා
මා ගොඩ ගත්තා බිලි කොකුවල අමුණා ලා

ජලයේ උන් මෙමට දැන් දිය පොදක් නැත
ඇව්වේ දැවෙන ගත ගිනියම් වේලා ඇත
මගේ ගත තුවාලය මට ඉවසුමක් නැත
මැරි මැරී උපදිනව මගෙ පණ යන්නේ නැත

දානපතියෝ පිරිසක් මා අත ගාලා
මිල යට ගත්ත මුවඟිනි සිනහව පාලා
මහ සඟරුවන වෙත මගෙ මස් දන් දීලා
මොක් සැප ලබන බව කියනව මුමුණා ලා

ඇයි මිනිසුනේ මා මරලා දන් දෙන් නේ
පර පණ නසා කෙලෙසද නිවනට යන් නේ
මගේ මස් බලෙන් අරගෙන ඔබ දන් දෙන් නේ
එය සොරකමක් බව ඇයි ඔබ නොසිතන් නේ

මහ සඟරුවන රස කර මගේ මස් ගිල ලා
බණ කියනවා දන්දෙන අනුහස් කිය ලා
මළ අයටත් ඉන්න අයටත් පින් දී ලා
මහ සඟරුවන වඩිනව මළකුණු ගිල ලා

මගෙන් සොරාගත් මගෙ මස් දන් දෙන්නේ
මගේ මස් වලින් ඔබේ දිව පින වෙන්නේ
මේවා ගැන කිසිත් උන් නෑ පව සන්නේ
මගේ මස් කාලා ඇයි මට පින් නොම දෙන්නේ



ශ්‍රීමත් සිරිල් ද සොයිසා මැතිතුමා

0719 850 841